# සන්නස SANNASA

## ලියා දක්වන මග

**අපේ සම්පත දරුවෝය. දරුවන්ට මග පෙන්වන්නෝ දෙමව්පියන් හා ගුරුවරුන් ය. කුඩා කල සිටම දරු වන්ගේ දක්ෂතා හඳුනාගෙන එම දක්ෂතා වැඩි දියුණු කර දීමෙන් ඔවුන් අති දක්ෂයන් බවට පත්වේ. ඔවුන්ගේ ලේඛන කුසලතාව වැඩි දියුණු කිරීම පුවත්පතක් වශයෙන් අපට කළ හැක. මේ ගැන ලියා ඇති අනාගත ශේක්ෂපියර් ලා යන ලිපිය වෙත ඔබේ අවධානය යොමු කරනු කැමැත්තෙමි. සිංහල දරුවන් අති දක්ෂයින් කිරීමට අප හැම දෙනා ඇප කැප වෙමු.**

**සංස්කරණය / Editor**
චිත්‍රාන් මොරකන්දෙ ගමගේ

අනුශාසක **/ Advisor**
දෙනගම සිරිවර්ධන මහතා

**ග්‍රැෆික් නිර්මාණ කරනය**
**Graphic Design by**
**Crystal D** Digital Agency
www.crystald.com.au

**රූ රටා**
අතුල කල්දෙමුල්ල

**සේයා රූ**
ප්‍රසන්න නාමල් කුරුකුලරත්න

**සන්නස පිරිවර**
සිසිර දිසානායක
ලක්ෂමන් කොඩිතුවක්කු
වික ධර්මබන්ධු
මහින්ද දිසානායක දිවුල්ගනේ
හර්ෂ කසුන්
ශනිල්ක නදීශාන්

**සම්බන්ධීකරණය**
**New South Wales**
ලක්ෂමන් කොඩිතුවක්කු
**Queensland**
ආනන්ද සමරතුංග
**Canberra**
අසෝක නිමලසිරි

**වෙළඳ දැන්වීම් / Advertising**
**Dilki : 0426 959 540**
info@sannasa.com.au
www.sannasa.com.au

**Sannasa Bank Account Details**
**Acc Name:**
Sannasa Media Group
**BSB:** 033 137 **AC:** 626 670

සන්නස පුවත්පතේ පළවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා, ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සළකන්න.




ඒ බව එක්සත් ජාතීන්ගේ නියෝජිතවරියත් තහවුරු කළා

- බොරු තහනම යස්මින් සුකාගේ සැලසුමක්ද
- ව්‍යාජ නම් 5 කින් පෙනී සිටි මාධ්‍ය පාර්ශවයක් සිදුකළ විපත
- හිටපු පොලිස්පතිවරයකු මේජර් ජන රාල්වරු දෙදෙනකු ඇතුළු 58 කට යුද අපරාධ චෝදනා
- උතුර ද්‍රවිඩ නිජබිම නිසා මේධාලංකාර හිමිගේ ආදාහනය පැවැත්වීම වැරදි බව විග්නේෂ්වරන් පවසයි
- ගනේෂ්ද්‍රකුමාර් - ආනන්දි සහ ෂි වාජිලිංගම් ජිනීවා මානව හිමිකම් කවුන්සිලයේදී ශ්‍රී ලංකාවට එරෙහි සතුරු ක්‍රියා
- ප්‍රභාකරන් ඝාතකයාගේ විශාල රුවක් ජිනීවාහිදී ප්‍රදර්ශනය කෙරෙයි



ප්‍රභාකරන්ගේ මස්සිනාවූ එම් කේ සි වාජිලිංගම් ඝාතන රැසකට සම්බන්ධ එල්ලන් නැමැති කොටි හමුදා නායකයාගේ බිරියවූ ආනන්දි සෂිදරන් සහ ද්‍රවිඩ ජාතික ජනතා පක්ෂයේ නායක ගජේන්ද්‍රකුමාර් පොන්නම්බලම් දැන් සිටින්නේ ජිනීවා මානව හිමිකම් කවුන්සිලය තුළය.

මේ පිරිස ශ්‍රී ලංකාවේ හමුදාවට එරෙහිව දියත් කරන සතුරු ක්‍රියාදාමය ගැන වත්මන් රජය හා එම රජයේ බලධාරීහු අවධානය යොමුකර නැත.

මෙවන් පසුබිමක් මැද ගජේන්ද්‍රකුමාර් පොන්නම්බලම් අප්‍රිකානු රාජ්‍යනොවන සංවිධානයකින් විනාඩි 2 ක කාලයක් කුලියට ගනිමින් මානව හිමිකම් සමුළුව ඇමතුවේය.

''වන්නි'' මෙහෙයුමේදී දසදහස් ගණනක් ඝාතනය වුණා. මේ නිසා ශ්‍රී ලංකාව ජාත්‍යන්තර අධිකරණයට ගෙන යා යුතුයි මහ කොමසාරිස්ගේ වාර්තාවෙන් ශ්‍රී ලංකාව බිහිසුණු අපරාධ සිදුකර ඇති බවට දක්වා තිබෙනවා. ඒ ගැන විමර්ශනය කිරීමට හයිබ්‍රිඩ් අධිකරණයක් ස්ථාපිත කළ යුතු බවට යෝජනා කර තිබුණා. එහෙත් ශ්‍රී ලංකා රජය විදේශ විනිසුරන් සහිත හයිබ්‍රිඩ් අධිකරණයක් පිහිටුවීම ප්‍රතික්ෂේප කර ඇත. මේ හැර ජනපති සහ අගමැති මෙන්ම විදේශ කටයුතු ඇමැතිවරයා ආරක්ෂක හමුදාවේ කිසිම පුද්ගලයෙක්ම නීතිය හමුවට ගෙනවිත් නැත.

මේ තත්ත්වය තේරුම් ගත් මානව හිමිකම් කවුන්සිලය ශ්‍රී ලංකාවට එරෙහිව නිසි පිය වර ගැනීමට මානව හිමිකම් කවුන්සිලය අභිබවා වෙනත් ක්‍රියාමාර්ග ගන්නැයි කවුන්සිලයේ සාමාජික රටවලින් ඉල්ලා තිබෙනවා. යුද්ධය අවසන් වී වසර 10 ක් ගතවූවත් විපතට පත්වූ ජනතාවගේ නියෝජිතයා ලෙස මා මානව හිමිකම් කවුන්සිලයෙන් ඉල්ලා සිටින්නේ ශ්‍රී ලංකාව අන්තර්ජාතික අධිකරණය වෙත ගෙනයන ලෙසයි.

ගජේන්ද්‍ර කුමාර මේ රාජද්‍රෝහි ප්‍රකාශය කරන අවස්ථාවේ මේසයට ගසා එය නතර කිරීමට ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ කිසිදු නිලධාරියකු සිටියේ නැත. එහෙත් චීනයට එරෙහිව විවිධ පාර්ශව සාවද්‍ය ප්‍රකාශ කරන අවස්ථාවේ මේසයට මහහඬින් ගසමින් එම ප්‍රකාශ නතර කිරීමට චීන නියෝජිතයා ක්‍රියාකරන අයුරු අපි දුටුවෙමු.

මේ අතර එක්සත් ජාතීන්ගේ හිටපු නිලධාරිනි යස්මින් සුකා මෙවර මානව හිමිකම් කවුන්සිලයට පැමිණියේ පිටු 140 ක අලූත් විමර්ශන වාර්තාවක් රැගෙනය. ඇය කොටි ඩයස්පෝරාවේ ප්‍රධාන කොන්ත්‍රාත්කාරියයි. සුකා තම වාර්තාවෙන් හිටපු පොලිස්පතිවරයෙක් හිටපු මේජර් ජනරාල්වරු දෙදෙනෙක් සහ ත්‍රස්ත මර්දන ඒකකයේ නිලධාරීන් 58 ක් වධකයන් ලෙස හඳුන්වනු ලැබුවාය.

ඇය තම වාර්තාවට අමුණා තිබූ ලේඛනයේ එම නිලධාරීන්ගේ නම්ද සඳහන් කිරීමට ඇය කටයුතු කර තිබුණි. එහෙත් ඇය චෝදනා එල්ල කර ඇති නිලධාරීන්ට එරෙහිව බොරු සාක්කි ලබාදී ඇති සාක්කිකරුවන් කවුදැයි තම වාර්තාවෙන් වසන් කිරීමට ක්‍රියාකර තිබුණි.